**සොරණාතොට ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබු අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 24 වන දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට සොරණාතොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

සමාලෝචිත වර්ෂයේ නිමකරන ලද කර්මාන්ත 09 ක වටිනාකම රු.3,955,526 ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබීමෙන් වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 **නොසැසඳුනු ගිණුම්**

----------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.1,717,374 ක් වු නමුත්, අදාළ උපලේඛනය අනුව එය රු.1,785,425 ක් වීමෙන් රු.68,051 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **<u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු රු.20,984,891 ක් වු ලැබිය යුතු ගිණුම් ශේෂය තුළ හිඟහිටි වරිපනම් රු.95,638 ක්, හිඟහිටි ප්‍රාග්ධන ආධාර රු.16,632,455 ක් හා හිඟහිටි වෙනත් ආදායම් රු.4,256,798 ක් ඇතුළත් විය.

(ආ) **ගෙවිය යුතු වියදම්**

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ වියදම් ණයහිමියෝ හා කර්මාන්ත ණයහිමියෝ රු.25,512,070 ක් හා විවිධ තැන්පත් රු.1,717,374 ක් ඇතුළත් විය.

1.3.4 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

-------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු.687,850,618 ක් වු ගිණුම් විෂයන් 05 ක් විගණනයේදි සතුටුදායක ලෙස සත්‍යාපනය/ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 **අනුකූල නොවීම්**

-------------------

1.3.5.1 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|
| | --------------------------------- | ----------- | ----------------------------- |
| | | රු. | |
| (අ) | 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ හා 1986 මාර්තු 10 දින අංක 392/9 ගැසට් පත්‍රයේ නියෝග අංක 67 | | සභාව අනුමත කරන ගොඩනැගිලි අයදුම්පත්වලින් අනුකූලතා සහතික ලබාදීමට කටයුතු කර තිබුණේ සියයට 37 ක තරම් අඩු ප්‍රමාණයක් සඳහා විය. |
| (ආ) | 1988 ප්‍රාදේශිය සභා රීති (මුල්‍ය හා පරිපාලන) | | |
| | i. 202 රීති | | මිලදී ගන්නා හා නිකුත් කරන සියලුම භාණ්ඩ නිසි පරිදි ගණනය කර තොග ලේඛණ හා පොත්වල ඇතුලත් කර යාවත්කාලින කර නොතිබුණි. |
| | ii. රීති 203, 204 | | 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ 06 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1.6 වගන්තිය | 57,630 | සභාවේ සේවය කර ස්ථාන මාරුවී ගිය විශ්‍රාම ගිය හා සේවය අතහැර ගිය නිලධාරින් / සේවකයින් 04 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.571 | 23,753 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් කර වසර දෙක ඉක්මවූ තැන්පතු 15 ක් නියාදනය කර නොතිබුණි. |
| (ඉ) | 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ චක්‍ර ලේඛ අංක 8 හි 3.9.1 ඡේදය | 2,552,940 | රුපියල් මිලියන දෙක ඉක්මවන කොන්ත්‍රාත් එකම කාලය තුළ ප්‍රජා පාදක සමිතියකට ලබා නොදිය යුතු වුවත්, එයට පටහැනිව එකම සමිතියකට කොන්ත්‍රාත් ලබාදී තිබුණි. |
| (ඊ) | 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පිඑෆ්/එෆ්එස්/අරමුදල්/එම්ජී/25/152දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | | කැබ් රථයක් ධාවනය සඳහා 2017 සැප්තැම්බර් 06 න් පසු රක්ෂණ ආවරණය ලබා ගෙන නොතිබුණි. |
| (උ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 987,674 | සභාව සතු වාහන 06 කට අදාළව ඉන්ධන පරික්ෂාවක් සිදු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.145,039 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,210 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම් හා රැස් කළ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 5,096,724 | 1,995,311 | 1,682,654 | 312,657 | 5,096,740 | 1779372 | 1,521,842 | 257,530 |
| (ii) කුලී | 509,800 | 395,364 | 358,600 | 36,764 | 1,526,000 | 373,963 | 344,145 | 29,818 |
| (iii)බලපත්‍ර ගාස්තු | 800,000 | - | - | - | 686,000 | - | - | - |
| (iv)වෙනත් ආදායම | 4,317,457 | 4,396,624 | 1,208,725 | 3,187,821 | 1880500 | 1,602,871 | 3,662 | 1,601,766 |
| එකතුව | 10,723,981 | 6,787,299 | 3,249,979 | 3,537,242 | 9,189,240 | 12,945,446 | 1,869,449 | 1,889,114 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල්කල ආදායම රුපියල් මිලියන 6.8 ක් වූ අතර, වර්ෂය තුලදී රැස්කල ආදායම රුපියල් මිලියන 3.3 ක් විය. කෙසේ නමුත් වර්ෂය අවසාන වන විට රුපියල් මිලියන 3.5 ක ආදායමක් රැස්කර ගැනීමට තිබුණු අතර, පෙර වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම සියයට 84 කින් ඉහල ගොස් තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 16 දිනැති අංක 1998 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව ත්‍රිරෝද රථ ගාල් සඳහා වාර්ෂික අවසර පත්‍රයකට රු.1,000 ක් අයකළ යුතු වුවත්, ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි වී ඇති ත්‍රිරෝද 73 ක් සඳහා ගාස්තු අයකර නොතිබීම හේතුවෙන් රු.73,000 ක ආදායමක් අහිමිවී තිබුණි.

#### 2.2.3 වෙළඳ බලපත්‍ර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(1) අනුව හා අංක 1998 දරන 2016 දෙසැම්බර් 16 දිනැති ගැසට් පත්‍රය ප්‍රකාරව මාර්තු 31 දිනට පෙර වෙළඳ බලපත්‍ර ලබාගත යුතු වෙළඳ ව්‍යාපාර 08 ක් සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,509,000 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.2,009,914 ක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරි සැලැස්ම

----------------------

සමාලෝචිත වර්ෂයේ සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

-----------------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව මඟින් ක්‍රියාත්මක කර තිබුණු කර්තව්‍යයන් දෙකක් ඉටු කිරීම සඳහා රු.996,958 ක් වැය කර තිබුණද, අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කර ගෙන නොතිබුණි.

(ඇ) අතහැර දැමූ කර්තව්‍යන්

---------------------------

සමාලෝචිත වර්ෂය තුළදී කර්තව්‍යන් දෙකක් ක්‍රියාත්මක කිරීමට යෝජනා සම්මත වී රු.20,400,000 ක ඇස්තමේන්තු සකස් කර තිබුණත්, මුදල් නොලැබීම් හා ඉදිකිරීම් තත්ත්වයේ ගැටළු නිසා ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දමා තිබුණි.

(ඈ) දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගත් ණය මුදල සඳහා ණය වාරික හා පොලිය නියමිත පරිදි නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,198,378 ක් හිඟව පැවතුණි.

(ඉ) පාරිසරික ගැටළු

-------------------

i. 2012 ඔක්තෝබර් 05 දිනැති අංක 1178/45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රාදේශීය සභා සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභාව විසින් වැලඳගෙන ඇති නමුත් කසළ බදු අයකිරීමට අවශ්‍ය පරිශ්‍රයන් හඳුනා ගැනීමට සහ බදු අය කිරීමට 2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කටයුතු කර නොතිබුණි.

ii. 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර ක්ෂේත්‍ර 06 ක ව්‍යාපාර 14 ක් සඳහා පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

(ඊ) **තිරසර සංවර්ධන ඉලක්ක**

------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2017 දෙසැම්බර් 31 දින තෙක් සකස් කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලී රු.233,525 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඌව පළාත් පාලන කොමසාරිස්ගේ 2012 ඔක්තෝබර් 16 දිනැති අංක 2012/02 දරන චක්‍රලේඛයේ (ආ) xiv ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ දේපල බදුදීමේ දී ඒ සඳහා මාස 06 ක ඇප තැන්පතු ලබාගත යුතු වුවත්, දුංහිඳ මංසන්දියේ වෙළඳ සංකීර්ණයේ ඉහල මහල කොටස මසකට රු.5,000 ක කුලියකට 2017 මාර්තු 06 දින සිට 2022 මාර්තු 06 දක්වා ලබාදී තිබුණු අතර, මේ සඳහා මාස 06 ක තැන්පත් රු.30,000 ක් ලබාගෙන නොතිබුණි.

3.3 **මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය තුල පුරප්පාඩු හතරක් හා අතිරික්ත සේවකයින් විසි දෙදෙනෙකු විය.

3.4 **හඳුනාගත් අලාභ**

-------------------

සොරණාතොට ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2012 ජූනි 14 දින දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණු රු.8,834,609 ක ණයමුදලට අදාළ ණයවාරික හා පොලිය නොගෙවීම හේතුවෙන් ණය මුදල 2015 සැප්තැම්බර් 28 දින ප්‍රතිව්‍යුහගත  කර තිබුණු බැවින්, නව ණය වටිනාකම රු.11,320,648 ක් විය. මේ හේතුවෙන් සභාවට රු.2,486,029 ක පාඩුවක් සිදුව තිබුණි.

3.5 **ප්‍රසම්පාදනය**

--------------

3.5.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

---------------------

2017 වර්ෂය සඳහා  ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

-----------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා  අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 **අභ්‍යන්තර විගණනය**

----------------------

2017 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | | ස්ථාවර වත්කම් හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හඳුනාගෙන ලේඛනගත කර නොතිබීම. |
| (ආ) | තොග පාලනය | (i) | සභාවේ විවිධ කර්මාන්ත සඳහා ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කිරීම් හා මිලදී ගැනීම් සඳහා ද්‍රව්‍ය අධියාචනා පත්‍ර හා ලැබීම් නියෝග නිසි පරිදි සටහන් කර නොතිබීම. |
| (ඇ) | වාහන හා යන්ත්‍ර උපකරණ | (i) | සභාවේ යන්ත්‍ර බාහිර පාර්ශවයන්ට කුලියට ලබාදීමේ දී විධිමත් අනුමැතිය හා අධීක්ෂණයක් නොතිබීම. |
| | | (ii) | යන්ත්‍ර උපකරණවල දෛනික ධාවන සටහන් විස්තර නඩත්තු කර නොතිබීම. |
| | | (iii) | වාහන පාලනය හා නඩත්තුව සම්බන්ධව කාර්මික නිලධාරීන්ගේ අධීක්ෂණය ලබාගෙන නොතිබීම. |